



SERENDIB lanka Travels
Gateway to Serendipity
COLOMBO From £305 + TAX
INDIA From £345 + TAX
FAR EAST From £385 + TAX
WOW Unbeatable Offer
Sea Freight From £10 a Tea Chest
1 Olympic way, Wembley HA9 0NP
Tele: 020 8782 1140 - Fax: 020 8782 1134
email: info@serendib-lanka.co.uk

VACANCY for Cashier / Book-keeper
Company based in London, Barking is looking for a Cashier / Bookkeeper for their warehouse. Applicants, please send your CV to:
Miss Nicole Chandrasinghe,
9 Atcost Road, Barking, Essex. IG11 0EQ.

බලන්න! මේ අපේ දරුවෝ!

සදා සමරමු - බැති සිතින් ඔබ !


කෝලිත කුමාර මහමුදලිගේ
378/10 E, 5වැනි පටුමග
රත්නාරාම පාර,
හෝකන්දර - උතුර.
උපත: 1988 මැයි 30


රාජරත්නම් රදීස්වරන්
UD 155,
ශ්‍රී ධර්මාරාම මාවත,
දෙමටගොඩ.
උපත: 1990 මාර්තු 20


විමුක්ති සජාන් තෙවරප්පෙරුම
31 A, "මවුන්ටන් විලේජ්"
ඇඳිරිකැළේ පාර, මිල්ලවත්ත,
කළුතර - උතුර.
උපත: 1989 ජූනි 15


සුපුන් හල්ලල
"සරත්ගල්ල"
85, වල්පොල,
අංගොඩ.
උපත: 1991 ජනවාරි 19


දිනුත් ප්‍රියසංබ
"හිල්ලනි" රණබාහුවත්ත,
යටියන,
අගලවත්ත.
උපත: 1991 නොවැම්බර් 21


තිවංක තිසේරා
43/6,
ගල්වල පාර
දෙහිවල.
උපත: 1990 පෙබරවාරි 28


එන්.එම්. එරන්ද චතුරංග
460/16,
බෞද්ධාලෝක මාවත
කොළඹ 07.
උපත: 1986 නොවැම්බර් 27


මලින්ද අරුමාදුර
(ප්‍රහුණුකරු)
අරඹවලවීව, තලල්ල - දකුණ,
ගන්දර.
උපත: 1981 නොවැම්බර් 21

කොටුව දුම්රිය ස්ථානයේ දී
කුරිරු ත්‍රස්තවාදයට ගොදුරුව
දැයෙන් සමුගත්
අභිමානනීය ඩී.එස්. සිසු දරුවන් අටදෙනාට
අපගේ උත්තමාචාරය!
ඩී.එස්. සේනානායක විද්‍යාලයීය
විදුහල්පති ඇතුළු ආචාර්ය මණ්ඩලය, සිසු දරුවන්,
ආදි ශිෂ්‍ය සංගමය සහ පාසල් සංවර්ධන සමිතිය

# වී ගොවීන් ගසාකෑම

## *එක් නිලධාරියෙක් ලක්ෂ 40 ක් සාක්කුවේ දාගෙන*

අම්පාර නාමල්තලාව ප්‍රදේශයේ ගොවීන්ගේ වී මිළට ගැනීමේදී ගොවිජන සංවර්ධන සභාවේ නිලධාරීන් රුපියල් හැට එක් ලක්ෂයකට අධික මුදලක් වංචාකර ඇති බව හෙළිවේ. අම්පාර සහකාර ගොවිජන සේවා කොමසාරිස් මාර්ග යෙන් නාමල්තලාව ගොවිජන සංවර්ධන සභාවට ලබා දී තිබුණු රුපියල් එක්කෝටි හතලිස් එක් ලක්ෂ හැට පන්දහස් තුන්සිය පණස් තුනකින් මේ මුදල වංචාකර තිබේ. එම ගොවිජන සංවර්ධන සභාවේ එක් නිලධාරියෙකු පමණක් රුපියල් හතලිස් හතර ලක්ෂ අනූඅට දහස් අටසිය හැත්තෑ හතක් පමණ වංචාකර ඇතැයි හෙළිවේ.

වී මිළදී ගැනීමේදී සහ ඊට අදාල සෙසු වියදම් දැරීමේදී බොරුනම් ඇතුළත් කර ඇති මේ නිලධාරියා තම පෞද්ගලික බැංකුගිණුමට ගොවිජන සංවර්ධන ගිණුමේ රුපියල් දහඅට ලක්ෂ හැටහතරදහස් විසි අටක් බැර කරගෙන ඇත.

එසේම වී මිළට ගත් බවට වවුචර්වල, මුදල් පොතේ සහ පිළිපත්වල ජදමබඑැර දෙසකි ව්‍යාජ නම් සඳහන් කර රජයේ ගිණුමෙන් රුපියල් විසි ලක්ෂයකට ආසන්න මුදලක් ලබාගෙන ඇත. ගෙවීම් වවුචර්පත් පිළියෙල නොකර මුදල් ගෙවීමෙන්ද සංවර්ධන සභාවටම අයත් නොවන වෙනත් චෙක්පත්වලින් මුදල් ගෙවීමෙන්ද ව්‍යාජ වවුචර්පත් වලින් මුදල් ගෙවීමෙන්ද ආදී වශයෙන් රුපියල් හය ලක්ෂ හැට දහසක් වංචාකර තිබේ.

ඒ නිලධාරියා හැරුණු විට තවත් නිලධාරීන් දෙදෙනෙකු රුපියල් ලක්ෂ එකහමාරකට ආසන්න මුදලක් වැය කර ඇති බව අනාවරණය වේ.

රජයේ ආයතනයක මුදල් කළමනාකරණයේදී තනිවම මුදල් වංචාවක් කළ නොහැකි අන්දමට නීති රීති පනවා ඇත.

චෙක්පතක් එක් නිලධාරියෙකුට ලිවිය නොහැකිය. වවුචර් පිළියෙලකිරීම, අනුමත කිරීම, නිර්දේශකිරීම, මුදල් පොතේ සහ වැය ලෙජරයේ සටහන් කිරීම, චෙක්පත ලිවීම, චෙක්පත අත්සන් කිරීම (අඩුම වශයෙන් චෙක්පත දෙදෙනෙකු අත්සන් කළ යුතුය. තනි නිලධාරියෙකුට කළ නොහැකිය) කෙනෙකු කළ කාර්යයක් තවත් කෙනෙකු පරීක්ෂා කළ යුතුය. තවත් කෙනෙකුගේ අවධානයෙන් බේරී කිසිවක් කළ නොහැකිය. එසේ ක්‍රියාත්මක විය යුතු ස්ථානයක මුදල් වංචාවක් වේ නම් ඉහළ නිලධාරීන් ඇස කට පියාගෙන සිටිය යුතුය. නැත්නම් ඉහළ අයගේ සහාය ද ලැබිය යුතුය. මෙම මහජන මුදල් ගසාකෑම ඉහළ සිට පහළ දක්වා සියළුම නිලධාරීන්ගේ සාමූහිකත්වයෙන් සිදුවී ඇති බව මහජනතාව විස්වාස කරති.

***කේ. එල්. කරුණාරත්න* Sri Lanka**

## ♥ පැටියො ඩාලිං



"පැටියෝ..... අන්න ලෝක සෞඛ්‍ය සංවිධානෙන් කොටින්ව බඩගින්නෙ තියන්න හොඳ නෑ කියලා ලොරි ගණනක් විස්කෝතු යැව්වලු උතුරට...."

"හැබැට..... එහෙනම් නෝර්වේ කස්ටිය ලැස්ති වෙච්චි ඒ විස්කෝතුත් එක්ක කන්න කොහෙල්-ගෙඩිත් යවන්න....."

"කොහොමත් ළඟදිම කොටින්ට කෙහෙල්ගෙඩි කන්න වෙනවා....."

Sam's
CHICKEN
CHICKEN
CHICKEN
සෑම්ස් චිකන්
Great Tasting! Great Value!
17 HIGH STREET, WEALDSTONE, HARROW HA3 5BY, TEL: 020 8861 1872
439 HIGH ROAD, WILESDEN, LONDON NW10 2JJ, TEL: 020 8451 7662
84 HIGH STREET, HARLESDEN, LONDON NW10 42J, TEL: 020 8838 2036
246 KINGSBURY ROAD, KINGSBURY, LONDON NW9 9HN, TEL: 020 8204 1432

# Sinhala Lesson 118 සිංහළ පාඩම

## සිංහල ඉගෙනීමට පහසු මගක් !

### The Perfect Participle - පූර්ව ක්‍රියාව

**More examples of Perfect Participles used in Sentences.**

මහල්ලා ටිකක් දුර ඇවිද වාඩිවීය.
The old man walked a short distance and sat down.
ගීතා ලාච්චුවක් ඇරලා කෝදුවක් එළියට ගත්තාය.
Geetha opened the drawer and took out a ruler.
පීටර් තමාගේ කැටයේ සල්ලි දමා/ දාලා හැංගුවේය.
Peter put money in his till and hid it.
සෙබළෝ සටන් කොට නගරය බේරාගත්හ.
The soldiers fought and saved the city.
ඔහුගේ පුත්තු වී විකුණා / විකුණලා පොහොසත්වූහ
His sons sold paddy and became rich.

**Translate these sentences into Sinhala.**

Lalitha sang a song and smiled
You washed and wiped the car.
They ate lunch and slept.
Kapila ran fast and caught the train.

**Speak, read and write Sinhala regularly**
**Try to recognise Perfect Participles in your reading.**

♦ ආචාර්යා සුභද්‍රා සිරිවර්ධන
Dr Subhadra Siriwardane - MA PhD London

# හරස්පද ප්‍රහේලිකා 96

***හරහට :***
1 ගමක නමකි
4 එළවළු වර්ගයකි..
5 කෑම කන්නට උදව්වේ.
7 තරහෙන් බලන.
9 මත්පැන් ගබඩාව
11 පහත් ගති ඇත්තා

***පහළට :***
1 දකුණේ වැවකි.
2 ඇනුනොත් විසය.
3 කනට ඇසෙන දේ
6 ප්‍රමාණය
8 සීසෑමට අවශ්‍යය 10 කෙටි නමකි.

| | | | | |
|---|---|---|---|---|
| 1 | 2 | | 3 | ■ |
| 4 | | ■ | 5 | 6 |
| 7 | | 8 | ■ | |
| | ■ | 9 | 10 | |
| 11 | | | | ■ |

***ගියවර නිවැරදි විසඳුම්***
***හරහට:*** 1 මනාප 5 පුයර 6 සියනෑ 8 අත්දිග 9 පිටු 10 නල
***පහළට:*** 1 මපුතු 2 නාය 3 පරසිත් 4 කුරුණෑගල 7 යදින 8 අටු

## නේක රසෙන් පිරිපුන් සිංහල ඉවුම් පිහුම්

# අල සහ නිවිති බැදුම
# Potato - Spinach Fry

***අවශ්‍ය ද්‍රව්‍ය :***

| | |
|---|---|
| මධ්‍යම ප්‍රමාණයේ අල ගෙඩි | 6 ක් |
| නිවිති කොළ ( spinach ) | රා: 1 ක් |
| ලියාගත් ලොකු බොම්බයි ලූනු ගෙඩි | 1 ක් |
| ලියාගත් අමු මිරිස් කරල් | 4 ක් |
| පොඩිකරගත් වියලි මිරිස් කරල් පහක්. | |
| සූදුරු තේ හැඳි | 1 ක් |
| සිහිනියට ලියාගත් සුදු ළූණු බික් | 4 ක් |
| තරමක ඉඟුරු කැබැල්ලක් | |
| කුඩුකරගත් අබ ඇට තේ හැඳි | ½ ක් |
| එළවළු තෙල් ටිකක් - අවශ්‍ය පමණ ලුණු | |

***සාදන ක්‍රමය :*** නිවිති කුඩා කෑලිවලට පිහියකින් ලියා ගන්න. අල පොතු හැර අඟලක තරමේ කැබලි වලට කපන්න. සාස්පානක තෙල් ලිප තබා රත් වුණ විට ඊට අල කැබලි දමා රන්වන් පාට වන තුරු බැදගන්න. ඉන්පසු අල ඉවතට ගෙන තෙල් බේරෙන්න ටිෂූ කොලයක් මතට දමන්න. දැන් ඒ සාස්පානටම නිවිති හැර අන් සියළු කළමනා දමා මඳ ගින්නේ බැදෙන්න හරින්න. බැදීගෙන එන විට ඊට නිවිති එකතු කර පියන හැර කූරුගාමින් මඳක් වේලා මැළවෙන්නට හරින්න. එහි දියර සිඳීගෙන එන විට බැදපු අල එකතු කර කළවම් කර ලුණු ද දමන්න. පියන නොවසාම හොඳින් කළවම් කරමින් තවත් ටික වේලාවක් ලිප උඩම තිබෙන්නට හැර බාගන්න.

♦ ***ශාන්තා එන්. මනම්පේරි***
ගලවිලවත්ත, හෝමාගම Sri Lanka